•

## ගෙඩි හා පතුල් පිළිකා සම්බන්ධ බබන් වෙදරාළලාගේ පාරම්පරික වෙදකම

පාරම්පරික වෛද්‍ය හර්බට් වෛද්‍යරත්න

ගෙඩි වණ පිළිකා විෂය පථය හා බැඳුණු පතුල් පිළිකා හා විවිධාකාරයේ ගෙඩි රෝග තත්ත්වයන් සමාජයේ ප්‍රචලිතය. මේ සඳහා ප්‍රතිකාර කිරීමේ දී බබන් වෙදරාළලාගේ වෙද පරම්පරාව විසින් අනුගමනය කරනු ලබන සුවිශේෂි ක්‍රම පවතී. සාම්ප්‍රදායික කෂාය, ගුලි, කල්ක, චූර්ණ ආදී ප්‍රතිකාර ක්‍රම මෙන් ම පාරම්පරික ආවේණික චිකිත්සා කර්ම ආරම්භ කිරීමට පූර්වයෙන් බුදුන් නමැද ආතුරයාට පිරිත් නූල් බැඳ, පිරිත් පැන් පානය කිරීමට සලස්වා ආශිර්වාද ලබා ගැනීම චාරිත්‍රය වේ.

ශරීරයේ ඇතිවන්නා වූ විවිධ ගෙඩි වර්ග සඳහා ප්‍රතිකාර කිරීම ස්ථානය අනුව විවිධ වේ. ප්‍රාථමික ප්‍රතිකාර ලෙස ගෙඩිය මර්දනය වී යාම සඳහා ඖෂධ වර්ග ආලේප කරයි. මෙහි දී බේඳුරු අල, කිඩාරම් අල, හොඬල අල, තොලබෝ අල භාවිත කරන අතර ගෙඩි පැසවා පුපුරා යන අවස්ථාවේ පවතී නම් අශුද්ධ අත්තන, බුරුල්ල ආදී ඖෂධ භාවිත කෙරේ. ගෙඩි ඉහිරී යෑම සඳහා භාවිත වන බබන් වෙදරාළලාගේ පරම්පරාවේ භාවිත වන ලේපයක් ලෙස ගැඩවිල් පස්, කෝමාරිකා මද හා හික් ලාටු අඹරා ආලේප කිරීම දැක්විය හැකිය. මින් ගෙඩිය වේදනාවකින් තොර ව ඉහිරී යෑම සිදුවේ. ප්‍රතිකාර කිරීම අපහසු ස්ථානවල පවතින ගෙඩි හැකිතරම් අභ්‍යන්තර ඖෂධ මාර්ගයෙන් අපද්‍රව්‍ය ලෙස ශරීරයෙන් බැහැර කර වීම සිදුකරයි. මීට අමතර ව ගෙඩි දුවවන ප්‍රතිකාර සිදුකරයි. මෙහි දී ප්‍රතිකාර කිරීම අපහසු ස්ථානයේ පවතින ගෙඩිය සඳහා ප්‍රතිකාර කිරීම පහසු ස්ථානය තෙක් බාහිරින් බෙහෙත් ආලේප කර ඒ සඳහා ආවේණික මන්ත්‍ර ද භාවිත කර අවශ්‍ය ස්ථානයේ ගෙඩිය මෝදුකර ප්‍රතිකාර කරනු ලබයි. මෙසේ ගෙඩි දුවවීම සඳහා තුත්තිරි, පල්මානික්කම්, හුඹස් ආස්මී භාවිත කරයි.

ප්‍රතිකාර එසේ වුව ද රෝගියාගේ තත්ත්වය බලා ජීවිතය ආරක්ෂාකර ගැනීම උදෙසා සැත්කම භාවිත කළ යුතු අවස්ථා ද ඇත. පාරම්පරික ගෙඩි ප්‍රභේද අතර හැට පැයේ ගෙඩි, තුන්තිස් පැ ගෙඩි ආදී ලෙස වර්ග ඇත. මෙම හැට පැයේ ගෙඩි උගුර ආශ්‍රිත ව ඇති වුවහොත් පැය විසිහතර ගතවන විට උගුර අවහිර වී රෝගියා ජීවිතක්ෂයට පත් වීම වුව විය හැක. එවැනි ප්‍රභේදයක් වන මසකා ගෙඩි අවදානම පිළිබඳ ව පාරම්පරික වෙද පොත්වල පහත පරිදි දක්වා ඇත.

දැලේ උගුර ගෙඩි දෙක වී නම් නිතින
ලීලේ නැතිව මසකා යයි දනු තොසින
කෝලේ නැතිව පිළියම් නොලදොත් එදින
රාලේ ගෙඩිය පැසුණු තැන වෙයි මරණ

මෙවැනි අවස්ථාවල දී ආයුධ භාවිත කිරීමට සිදුවන අතර, එමඟින් භාවීම ඉවත් කර තුවාල පුච්චා රුධිර වහනය නතර කර ප්‍රතිකාර සිදු කළ යුතු වේ.

පතුල් පිළිකා සඳහා ප්‍රතිකාර කිරීමේ දී ඖෂධීය පැලැස්තර යොදා පිළිස්සීම සිදු කරයි. මේ සඳහා යොදා ගන්නා ඖෂධ අතර අශුද්ධ රත්නිටොල් ප්‍රමුඛ වේ. මෙහි දී විෂ මරා ශුද්ධ තත්ත්වයට පත් කළ විට රත්නිටුල්වල පිළිස්සීමේ ගුණය හීන වේ. එබැවින් අශුද්ධ තත්ත්වයන් භාවිත කරයි. දින කිහිපයක් පැලැස්තර යෙදූ පසු පතුල් පිළිකාව පිළිස්සී යයි. ඖෂධීය දියර වර්ගවලින් සේදීමෙන් විෂබීජ විනාශ වේ. පතුල් පිළිකාව ලේඛනය වීම සඳහා අශුද්ධ ජයපාල බීජ, මීමුරුවට යොදාගනී. අශුද්ධ ජයපාල බීජවල පවතින තෛලමය පදාර්ථ ලේඛනය සඳහා වැදගත් වන අතර පල්මානික්කම්, පුෂ්කර, වෙඩිලුණු හා කංසා ද පතුල් පිළිකා ලේඛනය සඳහා බබන් වෙදරාළලාගේ වෙද පරම්පරාව විසින් යොදා ගත් අතර වර්තමානයේ දී ද යොදා ගැනීම සිදු වේ.